


**ඇයි මේ වගේ නිර්මාණයක් කරන්න හිතුවෙ?**

දක්ෂ ගායක ගායිකාවන්, නැටුමට රැගුමට හපන් අය, දක්ෂ පිටපත් රචකයන්, රචිකාවියන්, කැමරා ශිල්පීන්, සංස්කරණ ශිල්පීන්, මෙල්බන් නුවර ඇති තරම් ඉන්නවා. මේ අයගේ දක්ෂකම් එක්තැන් කිරීමේ අභිලාශයෙන් තමයි අපි මෙහෙම දෙයකට අත ගැහුවෙ.

**මේ ඩීවීඩී තැටිය නිර්මාණය කරන්න මුල් වුණ අය කව්ද?**

ශ්‍රීලාල් කටුනායක, නුවන් සමරපති, ට්‍රීසා කටුනායක, නයෝමි කන්නන්ගර, ෂනුක කටුනායක සහ ෂයනා කටුනායක ප්‍රධාන වශයෙන් මෙයට මුල් වුණා. ඇත්තටම අපට මේ කැරෝකේ තැටිය සාර්ථකව නිම කරගන්න ඉඩ ලැබුණේ මේ අයගේ අති මහත් කැපවීමත්, අන්‍යොන්‍ය අවබෝධයත් නිසාය කියලා කිව්වොත් නිවැරදියි.

*විවිධ දක්ෂතා වලින් පරිපූර්ණ නිර්මාණ කරුවන් නිර්මාණ කාරියන් අඩු නැති මෙල්බන් පුරවරයෙන් තවත් අලුත් නිර්මාණයක් බිහිවෙන පුවත අපට සතුටක්. ගායක ගායිකාවන් දහ දෙනෙකුගේ ගීත ඇතුළත් සිංහල කැරෝකේ ඩීවීඩී තැටියක් බිහි කරන්නට සමත් වුණ මෙල්බන් තරුණ පිරිස සමග සංවාදයක යෙදෙන්නට පසුගියදා සන්නසට හැකිවුණා.*

**ඩීවීඩී කැරෝකේ තැටියක් වගේ දෙයක් කරන්න හිතුවෙ ඇයි?**

අපි දැක්කා මෙහේ ඇති තරම් සම්පත් තියෙනවා. අපට පෙනුණා මේ සම්පත් වලින් නිසි ප්‍රයෝජන ගත්තොත් ලොකු දෙයක් කරන්න පුළුවන් නේද කියලා. කැරෝකේ අද ලංකාවෙත් ඉතා ජනප්‍රිය කලාවක්. පවුලේ හැමෝටම එකට ඉඳ විනෝද වෙන්නත් රස විඳින්නත් පුළුවන්. කැරොකේ ගී ගායනයට ගොඩක් දෙනෙකුට සහභාගි වෙන්නත් පුලුවන්. අලුත් යමක් කිරීමේ අවශ්‍යතාව අපට තදින්ම තිබුණා. වැඩි දෙනෙක් නොහිතන දෙයකට අපේ හිත යොදවන්න ඒකත් හේතු වුණා.

**මොන පදනමක් යටතේද මේ තැටියට ගීත තෝරා ගත්තෙ?**

2004 අප්‍රේල් මාසය වෙනකොට මෙල්බන් වල එළිදැක තිබූ සංයුක්ත තැටිවල තමාගේම ගීතයකට හිමිකම් තිබෙන අයට තමයි අපි ආරාධනා කළේ. නම් වශයෙන් කීවොත් විජිත අමරසේකර, කැමරන් කොළඹගේ, ලලිත් අරුණශාන්ත, හේමන්ත ඩයස්, හර්ෂ ජයවීර, රෝහණ කරුණාරත්න, අසුන්තා කරුනාරත්න, දයා සිල්වා, නාලක/වාසනා වීරකෝන්, සමන්තා/කාංචනා වීරරත්න යන ගායක ගායිකාවන් මෙයට හවුල් වුණා.

**ඒ අයට අමතරව..**

මෙල්බන් හි ජීවත් වන, නැටුමට සහ රංගනයට දක්ෂකම් කියන 45 කට වඩා අධික පිරිසක් සහභාගි වුණා. අපේ ලාබාලම රංගන ශිල්පිනියගේ වයස මාස 3 යි. මේ සියලු දෙනාම තමනගේ උපරිම දක්ෂතාවයෙන් හා කැපවීමෙන් අපට හවුල් වුණා.

විශේෂයෙන් කිව යුතු කාරණය තමයි මේ කිසිම කෙනෙක් මූල්‍යමය ප්‍රතිලාභයක් බලාගෙන නෙවෙයි මේ කටයුත්තට එකතු වුනේ. අවුරුදු එකහමාරක් සීතල, උණුසුම, අව්ව, වැස්ස දරාගෙන විශාල කැපවීමක් කරලා කිසිම මැසිවිල්ලක් නැතිව තමන්ගෙ මෙහෙවර ඔවුන් ඉටු කළා. සමහර දවස් වල කෑම බීම පවා නොතකා අපට සහය දුන්නා. ඉතින් අපට සහය දුන් ගායක ගායිකාවන් රංගන ශිල්නිනියන් සියලු දෙනාගේම හැකියාවන් මේ රටේ පමණක් නෙවෙයි මුළු ලොවටම ප්‍රදර්ශණය කරන්න අපි දැන් වැඩ පිළිවෙලක් යොදලා තියෙනවා.

***මුහුණ දුන්න අභියෝග ගැන කතා කළොත්..***

අපේ සාමාන්‍ය ජීවිතයේ වැඩ කටයුතු අතරේදී තමයි මේ කාර්යය කෙරුණේ. රූ ගත කිරීම් කරන අවස්ථා වල දින ගණන් ඒ වෙනුවෙන් වැය කරන්නට සිදුවුණ වාර අනන්තයි. දර්ශණ රූතල තොරා ගැනීමටත් විශාල කාලයක් ගියා, අවශ්‍ය වන ඇඳුම් පැළඳුම් හැම දෙයක්ම අපි සාකච්චා කරළා තමයි තොරා ගත්තේ.

සමහර දවස් වල අපේ වැඩ වලට කාලගුණය හරස් වුණා. සංස්කරණ කටයුතු කරද්දිත් අපි දවස් ගානක් නිදි මරන්න ඇති. නමුත් අවසාන ප්‍රතාඵලය දැක්කහම අපට අපි වින්ද දුක අමතක වුණා. ඇත්තටම මේ අභියෝග ඉදිරියේ අපි ේනාසැළී සිටියේ අපි අතර තිබුණ මිත්‍රත්වයත් ආත්ම විශ්වාසයත් නිසයි කිව්වොත් නිවැරදියි.

***ඉතින් කවදද මේ කැරෝකේ තැටිය එළි දක්වන්නෙ..?***

**2005 ඔක්තෝබර් 30 වන ඉරිදා සවස 3** සිට 5 දක්වා ඩීකින් සරසවියේ බර්වුඩ් මන්ඩපයේ දේශණ ශාලා අංක 1 හිදී එළි දැක්වීම සිදු කරනවා. අපේ සියලුම කලාකාමී හිතවතුනට හිතවතියනට අපි ආරාධනා කරනවා එතැනට පැමිණ මේ සතුට අප සමග බෙදා ගන්නා ලෙස. ඒ වගේම මේ අවස්ථාවේදී, ඩීවීඩී කැරෝකේ තැටියට සහභාගි වුණ සැමටත්, අප ගැන විශ්වාසය තබා වසර එකහමාරක් පමණ කාලයක් ඉතාම ඉවසිලිවන්තව බලාපොරොත්තු තබාගෙන සිටි මෙල්බන් රසික කැලත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

සාකච්ඡා කළේ ජගත් ජේ එදිරිසිංහ
ට්‍රීසා කටුනායක සමග

